www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධයට සහ සමාජ අසමානතාවයට එරෙහිවීමට සමාජවාදී මූලෝපාය අවශ්‍යයයි

## Socialist strategy needed to oppose war and social inequality

**ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**

**2007 සැප්තැම්බර් 7**

යුද්ධය, මිලිටරිවාදය, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මත එල්ල කෙරෙන ප්‍රහාර සහ ගැඹුරු වන්නා වූ සමාජ අසමානතාව යනාදියට එරෙහිව සටන් කිරීමට භූගෝල පරිමාන මහජනතාව මාවතක් සොයමින් සිටිති.

නොසන්සුන්තාව පිලිබඳ ගැඹුරු හැඟීමක් සහිත ඔවුහු බිහිසුනු ව්‍යසනයන් - එනම් ඉරාකයේ සහ ඇෆ්ඝනිස්ථානයේ යුද්ධවල තවදුර පුපුරායාමක්, ඉරානය මත ප්‍රහාරයක්, ගෝලීය මූල්‍ය පද්ධතියේ වැඩෙන කුනාටුව මධ්‍යයේ ආර්ථික වියවුලක අවකාශය, ඔවුන්ගේ නගර සහ උපනගරවල මූලික යටිතල පහසුකම් බිඳ වැටීමක් පිලිබඳ පෙර නුවූ විරූ අන්තරාය හා දේශගුන වෙනස්වීම් සහ පාරිසරික විනාශය විසින් නිෂ්පන්න කරන ලද "ස්වාභාවික" ආපදාවන්- ඉදිරියේ වැටී ඇති බව හඟිති.

එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව් බුෂ්, රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පූටින්, ජපාන අගමැති ෂින්සෝ අබේ සහ චීන ජනාධිපති හියු ජින්ටාඕ ද ඇතුලත්ව ලෝක දේශපාලන නායකයන් 21 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන ආසියා ශාන්තිකර කලාපීය ආර්ථික සහයෝගිතා (ඇපෙක් ) සමුලුව අතරතුර සිදු කෙරෙන විරෝධතාවලට සහභාගිවීමට සෙනසුරාදා සිඩ්නි නගරයේ වීදිවලට දහස් ගනන් ජනයා පැමිනීම මෙම මනෝගතීන් විසින් දැක ගනු ඇත.

එහෙත් 1999 දී සියැටල් නගරයෙන් ඇරඹී 2003 පෙබරවාරි මාසයේ දී ඉරාක යුද්ධයට එරෙහි විරෝධතාවල දී ඉහල ලක්ෂ්‍යයක් කරා ලඟා වූ එවැනි විරෝධතා දැක්වීම්වල අට වසරකට පසුව දේශපාලන ශේෂ පත්‍රයක් සකසා ගැනීමට කාලය එලැඹ ඇත. එවැනි විරෝධතාවන් කොතරම් විශාල වුවත්, ඒවාට සහභාගි වන්නන්ගේ අභිප්‍රායන් කොතරම් අවංක වුවත්, ජාත්‍යන්තර අත්දැකීම් විසින් අනාවරනය කොට ඇත්තේ පවත්නා දේශපාලන සංස්ථාපිතයට පීඩනය යෙදීම මගින් ඔවුන්ගේ පිලිවෙත් වෙනස් කල හැකි යයි යන සංකල්පනාවේ ආධිපත්‍යයට ලක්ව පවතින තාක් දුරට ඒවාට, යුද්ධය, මර්දනය සහ සමාජ ප්‍රතිගාමිත්වය යන ගැටලු විසඳාලිය නො හැකි බවයි.

සිඩ්නි නගරයේ දී මෙය යලිත් අවධාරනය කෙරී ඇත. නගරයේ බොහෝ කොටස් තථ්‍ය මිලිටරි - පොලිස් රාජ්‍යයක් බවට පරිවර්තනය කරනු ලැබ තිබේ. පොලිසිය වෙත ඉහවහා යන බලතල ලබා දී ඇති අතර දේශීය "ආරක්ෂක" ක්‍රියාන්විතයන් සඳහා සන්නද්ධ හමුදා මුදා හැර තිබේ. විරෝධතාවන් සහ ඒවායේ යෙදෙන්නන් "ප්‍රචන්ඩ" යයි නිරන්තරයෙන් හෙලා දකින අතරේ ජල උන්ඩ සූදානමේ තබා තිබේ. මේ සියල්ල විසින් පැහැදිලි ලෙස පෙන්නුම් කරනු ලබන්නේ ඊනියා "ත්‍රස්තයට එරෙහි යුද්ධයේ" යථා අන්තර්ගතයයි. ඉරාකයේ, ඇෆ්ඝනිස්ථානයේ, නැගෙනහිර ටිමෝරයේ හෝ සොලමන් දූපත්වල වේවා විදේශීය මිලිටරිමය අල්ලා ගැනීමේ වැඩ පිලිවෙල දේශීයව මිලිටරිවාදය සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මර්දනය කිරීම ඇඟවුම් කරයි.

සිඩ්නි නගර මධ්‍යය වටකරමින් ද ඇපෙක් ක්‍රියාකාරකම් වටා බහිෂ්කාරක කලාපයක් ස්ථාපනය කරමින් ද පිහිටුවා ඇති කිලෝ මීටර 5 ක් දිග, මීටර් 2.8 ක් උස වානේ සහ කොන්ක්‍රීට්වලින් තනන ලද තාප්පය ලොව පුරා ආන්ඩු ඒවා නියෝජනය කරන්නේ යයි කියන පලල් මහ ජනකායන්ගෙන් මුලුමනින් ම හුදකලා වී ඇති ය යන්න පිලිබඳ භෞතික සාධනයයි. තවද හොවාඩ් ආන්ඩුවේ මිලිටරි-පොලිස් පියවරයන්වලට ලේබර් "විපක්ෂය" ලබා දෙන පිලිකුල් සහගත සහයෝගය තවත් විශ්වීය ක්‍රියාදාමයකට, එනම් නිල දේශපාලන සංස්ථාපිතයේ කිසිදු කොටසක් තුල මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්වල ආරක්ෂාව සඳහා නියෝජනයක් නොමැති බවට, ආදර්ශයක් සපයයි.

මෙම ජාත්‍යන්තර පරිමාන අත්දැකීම්වල පාඩම් උකහා ගැනීමේ අර්ථය වන්නේ සෙනසුරාදා පැවැත්වෙන විරෝධතා දැක්වීම් සංවිධානය කරන්නන් විසින් අභිවර්ධනය කෙරෙන මිථ්‍යාවන්ගෙන් දේශපාලනිකව බිඳී වෙන්වීමයි. බුෂ්ව නවතනු යන සභාගයට අනුව නම් 2003 ලෝක පරිමාන යුද විරෝධී රැස්වීම් මගින් ඉරාකය ආක්‍රමනය කිරීමට ගෙන ගිය " කම්පනයේ සහ බියකරුභාවයේ" උද්ඝෝෂනයේ බලපෑම අඩු කල හෙයින් ඒවා සාර්ථක ය. මෙම සාහසික කියාපෑමේ එල්ලය වන්නේ සත්‍යය යටපත් කිරීමයි.

එනම් මූලික ආක්‍රමනයේ දී ද ඉන්පසුව ද එක්සත් ජනපද නීත හමුදාවන් සහ ඔවුන්ගේ සගයින් විසින් ඉරාක ජනයාට එරෙහිව ක්‍රියාවට දමන ලද සාහසික අපරාධ මිනිසුන් මිලියනයක් පමන ඝාතනයට, තවත් මිලියන කිහිප ගනනක් සරනාගතයින් බවට පත් කිරීමට හා ඉරාක සමාජය තථ්‍ය ලෙස ම විනාශභාග කිරීමට හේතු භූත වී ඇති බව වසන් කිරීමයි. ඊට අමතරව අවුරුදු හතරහමාරකට පසු ව යෝධ ස්ථිර මිලිටරි කඳවුරු පිහිටු වීම ඇතුලත්ව අවිනිශ්චිත කාලයක් සඳහා ඉරාකයේ රැඳී සිටීමට එක්සත් ජනපදය කැපවී සිටිනවා පමනක් නොව ඉරානයට එරෙහිව නිර්දය මිලිටරි ප්‍රහාරයක් සූදානම් කරමින් සිටී.

බලයේ සිටින අය මත ඇති තරම් පීඩනය යොදතොත් පවත්නා ධනේශ්වර සමාජ දේශපාලන පර්යායේ රාමුව තුල ම "වෙනස් ලොවකට ඉඩ ඇත" යන මිථ්‍යාව විරෝධතා කන්ඩායම් විසින් වගා දිගා කරනු ලබති. නැවත වතාවක් මෙය එල්ල කරනු ලැබ ඇත්තේ මෙම සමුලුවේ දී ඕනෑවටත් වඩා පැහැදිලි වන මානව ශිෂ්ඨාචාරය මුහුන දී සිටින වැඩෙන අන්තරායන් පිලිබඳ සැලකිලිමත් වන අයගේ ඇස්වලට වැලි ගැසීමටයි.

වියට්නාම් යුද විරෝධී ව්‍යාපාරය සමග සන්සන්දනයන් කිරීමට දරන උත්සාහයන් වර්තමාන යුද්ධයේ සාරභූත අන්තර්ගතය වසන් කරන නිසා මුලුමනින් ම වැරදි දිශාවකට යොමු කෙරී ඇත.

වියට්නාමයේදීට වඩා බොහෝ දෑ ඇමරිකානු පාලක ප්‍රභූව ඉරාකයේ දී පරදුවට තබා තිබේ. ඉරාක යුද්ධයේ එල්ලය වන්නේ හුදෙක් එක් රටක් අල්ලා ගැනීම පමනක් නො වේ. එය වනාහි විසිවන ශතවර්ෂයේ මුල් භාගයේ ලෝක යුද්ධ දෙකකට පසුව ඇමරිකානු අධිරාජ්‍යවාදය ලඟා වූ ලෝකාධිපත්‍යය පවත්වා ගෙන යාමටත් එම අධිරාජ්‍යවාදයේ ඓතිහාසික පරිහානිය ජය ගැනීමටත් මිලිටරි බලය යොදමින් දරන මංමුලා සහගත ප්‍රයත්නයේ කොටසකි.

ගෝලීය ආධිපත්‍යය සඳහා එක්සත් ජනපදය දරන මෙම ප්‍රයත්නය "ත්‍රස්තයට එරෙහි යුද්ධය" යන බැනරය යටතේ දියත් කරනු ලැබෙමින් තිබේ. එහි නාභිය වන්නේ යෝධ තෙල් හා ගෑස් නිධිවලින් පොහොසත් මැද පෙරදිග හා මධ්‍යම ආසියානු කලාපයයි. තම පැරනි යුරෝපීය ප්‍රතිමල්ලවයන්ට මෙන් ම නැගී එන ගෝලීය බලයන් වන චීනය සහ රුසියාවට එරෙහිව තමාගේ ස්ථානය රඳවා තබා ගැනීමට එක්සත් ජනපදය මෙම සම්පත් පාලනය කල යුතු ය.

අවසානයේ 1914 දී පලමු ලෝක යුද්ධයට මග පෑදුවා වූ ද ඉන් යන්තම් දශක දෙකකට පසුව දෙවන ලෝක යුද්ධයට හේතු භූත වූ ද විසිවන ශතවර්ෂයාරම්භයේ දී ලෝකය සුන්බුන් බවට පත් කල අන්තර් අධිරාජ්‍යවාදී සතුරුකම් සහ ප්‍රතිසතිතාවන් දැන් යලිත් ඉස්මත්තට පැමින ඇත.

දහනව වන ශතවර්ෂය අවසානයේ දී ජර්මනිය සම්බන්ධයෙන් පැරනි යුරෝපීය බලවතුන් කල අත්වැරැද්ද පුනර්කරනය නොකරමින් ඇපෙක් සමුලුවේ මුඛ්‍ය කර්තව්‍යක් ලෙස චීනය ජාත්‍යන්තර සම්බන්ධතා පද්ධතිය තුලට සමාග්‍රහනය කර ගත යුතු බවට හිටපු ඕස්ට්‍රේලියානු අගමැති පෝල් කීටින් කල අනතුරු හැගවීමට හේතු වූ ගැඹුරු වන්නා වූ ගැටුම් ඇති තරම් පැහැදිලි ය.

එහෙත් අන්තරායන් කොතරම් පැහැදිලි වුවත් අනතුරු ඇගවීම් කොතරම් සෝෂාකාරී වුවත් ප්‍රතිමල්ලව ධනේශ්වර බලයන්ගේ අවශ්‍යතා අතර ඇටුම සාමකාමීව සමහන් කරනු ලැබිය නො හැක. අවසන් විග්‍රහයේ දී ලෝක යුද්ධය ජනනය කරන්නේ ධනේශ්වර දේශපාලඥයන්ගේ අභිමතාර්ථයන් නො වේ. යුද්ධය කරා ඇද වැටීම වනාහී නිෂ්පාදන බලවේගයන්ගේ ගෝලීය වර්ධනයත් ධනේශ්වර ලාභ පද්ධතියේ රාමුව හැඩ ගන්වන තරගකාරී ජාතික රාජ්‍ය පද්ධතියත් අතර වෛෂයික පරස්පර විරෝධයේ ප්‍රකාශනයකි.

සෑම ප්‍රධාන ධනේශ්වර බලයක් ම මෙම පරස්පර විරෝධය විසඳාලීමට තැත් කරන්නේ තමන්ගේ ම ගෝලීය පදනම ශක්තිමත් කර ගැනීමෙනි. එහෙත් එසේ කිරීම මගින් එය එහි ප්‍රතිමල්ලවයන්ගේ ආර්ථික, දේශපාලනික සහ මිලිටරිමය අවශ්‍යතා සමග ගැටුමකට එලැඹේ.

විසිවන ශතවර්ෂයේ මුල්භාගයේ දී සමාජ ආර්ථික සමුලෝත්පාටනයටත් දස මිලියන ගනන් ජනයාගේ මරනයටත් හේතුභූත වූ මෙම අන්තර් අධිරාජ්‍යවාදී  සතුරුකම් දෙවන ලෝක යුද්ධයෙන් පසුව ගත වූ දශකවල දී යටපත් කරන ලද නමුත් කිසි විටෙක ඒවා ජය ගැනුනේ නැත. එක්සත් ජනපදයේ ආර්ථික ආධිපත්‍යය සහ සෝවියට් සංගමය සමග පැවති සීතල යුද්ධය යන සාධක දෙක අන්තර්ජාතික සබඳතාවල රාමුව පරිපාලනය කිරීමේ රාමුව සම්පාදනය කර දුන්නේ ය.

පසු ගිය දශක එකහමාර තුල දී සෝවියට් සංගමය බිඳ වැටීමත් එක්සත් ජනපදයේ ආර්ථික ඛාදනයත් ජාත්‍යන්තර තත්වය පරිවර්තනයට ලක් කොට ඇත. බුෂ් පරිපාලනයේ අපරාධකාරී ස්වභාවයත් ඩිමොක්‍රැටික් පක්ෂයෙන් එයට ලැබෙන සහයෝගයත් පිලිබිඹු කරන්නේ එක්සත් ජනපදය තම ගෝලීය ආධිපත්‍යය පවත්වා ගෙන යාමට දරන ජීවිතයත් මරනයත් අතර අරගලය යි.

අන්තර්ජාතික සබඳතාවල පශ්චාත් යුදකාලීන රාමුව බිඳී විසිරී ඇතුවා පමනක් නො වේ. විශේෂයෙන් ම චීනය හා ඉන්දියාව ඇතුලු නව බලවතුන්ගේ ඉස්මතු වීම දැකගෙන ඇති ගෝලීයකරන සන්තතීභූ ලෝක ආර්ථිකය හා ධනේශ්වර ජාතික රාජ්‍ය පද්ධතිය අතර පරස්පර විරෝධය තීව්‍ර කොට ඇත්තාහ. මේ තතු යටතේ නව අන්තර්-අධිරාජ්‍යවාදී ගැටුම් සඳහා කොන්දේසි නිර්මානය කරනු ලැබේ. ඉරාකයේ සහ

ඇෆ්ඝනිස්ථානයේ යුද්ධවල ඓතිහාසික අර්ථභාරය එයයි. බුෂ් සඳහන් කොට ඇති පරිදි එම යුද්ධ වෙන් වූ ගැටුම් නොව එකම යුද්ධයේ වෙනස් රංගශාලා පමනි.

යුද්ධවල නව යුගයකට පිටුපසින් ඇති වෛෂයික සමාජ හා ආර්ථික බලවේගයන් හඳුනා ගැනීම එක් නිගමනයකට ම පමනක් යොමු වේ: එනම් යුද්ධයට එරෙහි අරගලය පාලක පන්තීන්ට හා ඔවුන්ගේ ආන්ඩුවලට විරෝධය දැක්වීමේ පදනම මත සංවිධානය කරනු ලැබිය නො හැකි බවයි. ඒ වෙනුවට එම අරගලය කල යුතු වන්නේ ධනේශ්වර ලාභ පද්ධතියත් එහි යල් පැන ගිය ජාතික රාජ්‍ය රාමුවත් නෙරපා හැරීම සඳහා ලොව පුරා වැඩ කරන ජනතාවන් එක්සත් කිරීම එල්ල කරගත් ජාත්‍යන්තර සමාජවාදී මූලෝපායක පදනම මතයි.

## ඇපෙක් සමුලුව පිටුපසින්

වේදිකාවට පිටුපසින් සිට කලමනාකරනය කරන ලද ඇපෙක් සමුලුව තුල පවා සට්ටන රේඛා ඉස්මතු වෙමින් තිබේ. නිල න්‍යාය පත්‍රයට පිටස්තරව බුෂ්, හොවාඩ් සහ අබේ චීනයට එරෙහිව ගොඩනැගෙන සන්ධානයක් තුල එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව හා ජපානය අතර වැඩෙන ආරක්ෂක සබඳතා තර කර ගැනීමට හමුවෙති.

වසන ලද දොරවලට පිටුපසින් කෙරෙන සාකච්ඡාවන්ගේ ස්වභාවය පිලිබිඹු කරමින් ම´ඩොක්ට අයත් ඕස්ට්‍රේලියන් පුවත් පත ආසියාවේ ආධිපත්‍යය දරන්නේ එක්සත් ජනපදය ද චීනය ද යන මැයෙන් ලිපියක් පල කලේ ය.

අර්ථභාරී ලෙස බුෂ්ගේ පැමිනීමෙන් පසුව නිවේදනය කරන ලද ඕස්ට්‍රේලියාව සහ එක්සත් ජනපදය අතර ඇති වූ ප්‍රථම එකඟතාව වන්නේ එක්සත් ජනපද මිලිටරියේ අධි බලැති තාක්ෂනයට අත ගසා ගැනීමට ඕස්ට්‍රේලියානු මිලිටරියට වඩ වඩාත් ඉඩ දීමයි.

තවද ඇයගේ එක ම මාධ්‍ය සම්මුඛ සාකච්ඡාවේ දී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩාලිසා රයිස්, ඉරාකයේ සහ ඇෆ්ඝනිස්ථානයේ පමනක් නොව සොලමන් දූපත් සහ ටිමෝරයේ ඕස්ට්‍රේලියානු මිලිටරියේ භූමිකාවට ද ෆීජිය සහ ටොන්ගා වැනි රටවල ඕස්ට්‍රේලියානු ආන්ඩුව කර ගෙන යන "අකීකරු කර්තව්‍යයන්ට" ද ප්‍රනාමය පල කලා ය.

නිල ප්‍රචාරක ව්‍යායාමය තුල ඇපෙක් සමුලුව මත් හුවා දක්වනු ලබන්නේ "නිදහස් වෙලඳපොලේ" සාර්ථකත්වයන්ට පිදෙන උපහාරයක් ලෙසිනි. හොවාඩ්ට අනුව විරෝධතා දැක්වීම් "ආර්ථික වර්ධනයට" හා එය නිෂ්පන්න කරන ධනේශ්වර පද්ධතියට එරෙහි "වෛරයකින්" ආවේශ ගැන්වී ඇත.

එය හා සමග ගැලපෙමින් "ධනවාදයට එරෙහි හති වැටුනු හා පැරනි පන්නයට අයත් උද්ඝෝෂනය" හෙලා දුටු ඕස්ට්‍රේලියන් පුවත් පත "මිනිසුන් මිලියන සිය ගනනක් දරිද්‍රතාවෙන් ඉහලට ඔසවා තැබීමට" ගෝලීය ධනවාදය ඉටු කරන භූමිකාවට ප්‍රසාදය පල කලේ ය.

සමුලුව වටා සිදු කෙරෙන යෝධ පොලිස්-මිලිටරි ක්‍රියාන්විතයන්ගෙන් පමනක් නොව ගෝලීය ධනේශ්වර ආර්ථිකයේ කේන්ද්‍රයේ මෑත කාලීන වර්ධනයන් මගින් ද උත්කර්ෂනයේ මෙමෙ ස්තුති තිකාවලට පහර එල්ල කෙරී ඇත.

දස වසරකට පෙරාතුව "නිදහස් වෙලඳපොලේ" ඉහල පූජකයෝ ආසියානු ආර්ථික අර්බුදය "ගජ මිතුරු ධනවාදයේ" ප්‍රතිඵලයක් ලෙස නො තකා හැරියහ. එහෙත් දැන් පැහැදිලි වන්නේ ලෝක ආර්ථිකයේ ඈත කොන්වල අසාධ්‍යත්වයක් ලෙස ඇරඹුනු දෙය මේ වන විට එක්සත් ජනපදය, යුරෝපය සහ ජපානය යන ආර්ථිකයේ කේන්ද්‍රස්ථානයන්ට ම පැතිරී ඇති බවයි.

එක්සත් ජනපදයේ ද්විතීයක උකස් අර්බුදය මගින් නිෂ්පන්න කරන ලද මූල්‍ය පද්ධතියේ ආසන්න උනුවීයාම වනාහී බැංකු සහ නය දෙන ආයතන විසින් ජනගහනයේ දරිද්‍රතම කොටස් ඔවුන්ට කිසිදා ආපසු ගෙවිය නො හැකි නය උගුල්වලට හසු කිරීමේ විපාකයයි. මෙය පෙර නො වූ විරූ මූල්‍ය පරපෝෂිතභාවයක වර්ධනය පිලිබඳ ඇඟවුමකි.

ගත වූ දශක කිහිපයේ දී සමස්තයක් ලෙස ලෝක ධනේශ්වර ආර්ථිකයට අත්තිවාරම වූයේ එක්සත් ජනපදයේ ආර්ථික ආධිපත්‍යය යි. එය පදනම් කරනු ලැබුවේ යන්ත්‍ර, සන්නිවේදනය, ප්‍රවාහනය, තාක්ෂනය ආදී වශයෙන් යෝධ නිෂ්පාදන කර්මාන්තවල වර්ධනය මතයි. එහෙත් එක්සත් ජනපද ආර්ථිකය මත ආධිපත්‍යය දරන්නේ නය ගසා කෑම සහ ලෝකයේ අනෙක් රටවල සැක නො කරන බැංකු සහ මූල්‍ය ආයතනවලට මූල්‍ය නිෂ්පාදන "විෂාදිය" විකිනීමට යන්තම් වැඩි දෙයකි.

පරපෝෂිතභාවයේ වර්ධනය කොතරම් ඔඩු දුවා තිබේද කිවහොත් මූල්‍ය පද්ධතිය පාලනය කිරීම තබා එය ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි කියාවත් තමන් හරියට ම නො දන්නා බව මහ බැංකුකරුවෝ පිලිගනිති.

මූල්‍ය කැලඹීම තාවකාලිකව සමහන් කරනු ලැබිය හැකි වුවත් දුරදිග යන ඇඟවුම් සහිත දිගු කාලීන සන්තතීන් ක්‍රියාත්මක වීම අරඹා ඇත. නය අර්බුදය හෙලිදරවු වීම පිලිබඳ අවිනිශ්චිතතාව නය වෙලඳපොලවල් පක්ෂාඝාත කොට ඇත්තේ එක්සත් ජනපද නිවාස වෙලඳපොලේ හැකිලීයාම ගෝලීය ප්‍රතිවිපාක සහිත අවපාතයක් අවුලුවාලීමට හේතුභූත වෙතැයි කෙරෙන අනතුරු ඇඟවීම් මධ්‍යයේ ය.

වෙනත් වචනවලින් කියතොත් දශකයකට පෙර ආසියා ශාන්තිකර කලාපයේ මිලියන නන් ජනයාට බලපෑ ආර්ථික විනාශය - මෙය මහා අවපාතයෙන් පසුව සිදු වූ බරපතල ම අර්බුදය යි - දැන් සමස්ත ලෝකවාසී වැඩ කරන ජනයාට තර්ජනය

කර සිටී. මෙම ගැඹුරට විහිදෙන අර්බුදයේ ක්ෂනික විපාකවල බර පොලී අනුපාත කැපීම සහ අනෙකුත් මූල්‍ය උපමාරු මගින් සැර බාල කරනු ලැබිය හැකි වුවත් එවැනි පියවරයන් තුලින් සිදුවනු ඇත්තේ එතරම් වැඩි කල් නො ගොස් ඉස්මතු වනු ඇති පුපුරනසුලු පරස්පර විරෝධයන් ගබඩා කිරීම පමනි.

යුද්ධයේ මෙන් ම මූල්‍ය බිඳ වැටීමේ හා ආර්ථික අවපාතයේ අනතුර විරෝධතා දේශපාලනය මගින් නවතාලිය නො හැක. ඒවා වනාහි සමස්තයක් ලෙස ධනේශ්වර පද්ධතියේ අසමර්ථතාව පිලිබඳ පැහැදිලි ම ප්‍රකාශනයෝ ය. ඒවා ගෝලීයකරනයේ ප්‍රතිඵලය නො වේ. ඊට ප්‍රතිමුඛව නිෂ්පාදන බලවේගයන් භූගෝලීය පරිමානයක වර්ධනය වීම මනුෂ්‍ය වර්ගයා මුහුන දී සිටින සියලු ගැටලු විසඳාලීමට වෛෂයික පදනම සම්පාදනය කර දෙයි. එහෙත් ලොව පුරා සිටින කම්කරු ජනතාවගේ සාමූහික ශ්‍රමයෙන් නිර්මානය කරන ලද මෙම නිෂ්පාදන බලවේග මානව වර්ගයාගේ අවශ්‍යතා ඉටු කිරීමට ප්‍රයෝජනයට නු ලැබිය හැකි වීමට ඒවා පුද්ගලික හිමිකාරිත්වයේ සහ ලාභයේ හනයෙන් මුදා ගනු ලැබිය යුතු ය.

ඕස්ට්‍රේලියාවේ ද සමස්ත ලෝකය පුරා ද ශිෂ්‍යයන් සහ කම්කරු ජනතාවන් මුහුන දී සිටින හදිසි කර්තව්‍යය වන්නේ සමාජවාදී ජාත්‍යන්තරවාදී වැඩ පිලිවෙල මගින් මග පෙන්වනු ලබන මහජන ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමයි. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හරහා දෛනිකව වර්ධනය කරන්නා වූ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සහ එහි ඕස්ට්‍රේලියානු ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරිදර්ශනය මෙය යි.

© www.wsws.org